Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

### නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ගණයට අයත් සංස්කාරක III ශ්‍රේණියේ සහ ලේඛන සහකාර III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2022

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සංස්කාරක III ශ්‍රේණියේ සිංහල සංස්කාරක තනතුරු 02ක, දෙමළ සංස්කාරක තනතුරු 02ක, ඉංග්‍රීසි සංස්කාරක තනතුරු 01ක සහ ලේඛන සහකාර III ශ්‍රේණියේ දෙමළ ලේඛන සහකාර තනතුරු 03ක, ඉංග්‍රීසි ලේඛන සහකාර තනතුරු 05ක පවතින පුරප්පාඩු පිරවීම සඳහා වන සුදුස්සන් තෝරා ගැනීමේ තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙනුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් සංස්කාරක III ශ්‍රේණියේ සහ ලේඛන සහකාර III ශ්‍රේණියේ තනතුරුවලට පත්කිරීම සඳහා තෝරාගනු ඇත.

01. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

1.1 මෙම තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් කලින් කලට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට පත්වීම්ලාභීන් යටත් විය යුතු ය.

1.2 මෙම තනතුරු සඳහා පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

1.3 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020ට අනුව තනතුරට බැඳී වසර 03ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා/රාජ්‍ය භාෂාවන්හි ප්‍රවීණතාවය ලබාගත යුතුය.

1.4 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

1.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරී නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ ප්‍රතික්ෂේප කරන හෝ මග හරින හෝ ඉල්ලුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට ඉඩ ඇත.

02 වැටුප් පරිමාණය :

මෙම තනතුරට අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව (MN 1-2016) රු. 27,140-10x300-11x350-10x495-10x660-රු. 45,540 ක මාසික වැටුප් පරිමාණයක් හිමි වේ.

03. සුදුසුකම්/පළපුරුද්ද :

සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාල සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

3.1 *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ගණිතය සහ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 04 කට අවම වශයෙන් සම්මාන සහිතව එක් වරක දී විෂයයන් 06ක් සමත්ව තිබීම.

*සහ*

(ආ) අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව හෝ ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

*සටහන* :-

(i) අයදුම්කරු විසින් තනතුර සඳහා ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යයට අදාළව අ.පො.ස. (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) භාෂා විෂයයන් සඳහා සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(ii) අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂා විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලැබූ ප්‍රමාණවත් අපේක්ෂකයන් සංඛ්‍යාවක් නොමැති වූ විට අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා ඇති අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා සාමාර්ථයක් හෝ සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

3.2 *පළපුරුද්ද :*

ලේඛන සහකාර තනතුර සඳහා අයදුම්කරන්නන් සඳහා පමණක් රජයේ පිළිගත් ආයතනයක පරිගණක කටයුතු පිළිබඳ අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබිය යුතුය. (Open Office - Microsoft Office - Word - Excel යනාදිය)

සංස්කාරක තනතුර සඳහා අයදුම්කරන්නන්ට පළපුරුද්ද අදාළ නොවේ.

3.3 *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය. (තෝරා ගනු ලබන අපේක්ෂකයින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කෙරෙනු ඇත.)

3.3 *වෙනත් සුදුසුකම් :*

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.,
ii. ඉල්ලුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

3.5 *වයස් සීමාව :*

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

04. *ලිඛිත විභාගය :*

4.1 ලිඛිත විභාගය : සංස්කාරක

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව හා අක්ෂර වින්‍යාසය පිළිබඳ දූනීම පරීක්ෂා කිරීම | පැය 1 1/2 | 100 | 40 |

4.1.1 *විෂය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා අක්ෂර වින්‍යාසය පිළිබඳ දූනීම පරීක්ෂා කිරීම | සෝදුපත් බැලීමේ නිපුණත්වය ඇගයීම සඳහා විශේෂයෙන් මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනවලට සම්බන්ධ සෝදුපත් බැලීමේ කොටස් දෙකකින් හා නිවැරදි සිංහල/දෙමළ හා අක්ෂර වින්‍යාසය පිළිබඳ දූනීම පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්නයක් සමග ප්‍රශ්න තුනකින් යුක්තව සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. **සැලකිය යුතුයි.**-අපැහැදිලි අත් අකුරු සහ අක්ෂර වින්‍යාසය දෝෂ සඳහා ලකුණු අඩුකරනු ලැබේ. |

4.2 ලිඛිත විභගය : ලේඛන සහකාර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40 |
| භාෂා හැකියාව | පැය 1 | 100 | 40 |

04. 2.1 *විෂය නිර්දේශය*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය, තර්කණ හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| භාෂා හැකියාව | අක්ෂර වින්‍යාසය, වියරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |

4.3 *බඳවා ගැනීමේ ක්‍රමය* :

ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40% කට වඩා ලබාගත් අයදුම්කරුවන්ගෙන් ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් (පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක්) නීති කෙටුම්පත් සම්පාදක විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින්, නිවේදනයේ සඳහන් සුදුසුකම් සහ කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සිදු කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

05. *විභාග කොන්දේසි* :

5.1 යම් අයදුම්කරුවකු තනතුරු දෙකම සඳහා අයදුම් කරන්නේ නම් අයදුම්පත්‍ර වෙන වෙනම ඉදිරිපත් කල යුතු ය.

5.2 විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දක්වෙන විභාග මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

5.3 *සාවද්‍ය තොරතුරු සැපයීම* :

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

5.4 *විභාග ගාස්තුව රු. 1000 කි.*

අයදුම්කරුවන් විසින් ආපසු නොගෙවනු ලබන රු. 1000 ක විභාග ගාස්තුවක් ''ලංකා බැංකුව අලුත් කඩේ'' ශාඛාවේ ''නීති කෙටුම්පත් සම්පාදක'' නමින් පවත්වාගෙන යනු ලබන අංක 7041488 දරන ජංගම ගිණුමට බැරවෙන පරිදි ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබා ගන්නා ලදුපතෙහි දාරය ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතු ය. එහි ඡායා පිටපතක් තමන් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තු ගෙවන ලද මුදල් තැන්පතු පත්‍රිකාවෙහි අයදුම්කරුගේ නම සහ ජාතික හැඳුනුම්පත් අංකය සටහන් කිරීම අනිවාර්ය වේ.

5.5 මෙම විභාගය ජුනි මස කොළඹ දී පැවැත් වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

5.6 අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව සඳහන් කළ යුතු ය. නිසි පරිදි අයදුම්පත් සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය, විභාග නිවේදනයේ දක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන*:- (ඉල්ලුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු, විශ්‍රාමික ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු හෝ රු. 240,360ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙකු ලවා සහතික කරවා ගත යුතු ය.)

ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩදෙනු නොලැබේ. නියමිත විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයක් පමණි. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

5.7 ඉල්ලුම්පත්‍ර මේ සමග ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රය ප්‍රකාරව සෙ. මී. 24 x 29 ප්‍රමාණයේ A 4 කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් සකස් කළ යුතු අතර,

(*අ*) අංක 1 සිට 7 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද,
(*ආ*) අංක 8 සිට 13 වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද,

(ඇ) අංක 14 සහ 15 ශීර්ෂ තෙවන පිටුවට ද ඇතුළත් වන සේ අයදුම්පත්‍ර පිළියෙල කළ යුතු ය.

5.8 නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනයට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් යොමුකොට ඇති ඉල්ලුම්කරුවන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලබයි. ඉල්ලුම්පත්‍ර ලැබුණු බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ පසු ඔබ විසින් අයදුම්පත්‍රයේ යොදා ඇති ජංගම දුරකතන අංකයට කෙටි පණිවිඩයක් එවීම මගින් ඒ බව දැනුම් දෙනු ඇත. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග අංශයේ දුරකථන අංක 011-5980225 ඇමතීමෙන් විභාග ප්‍රවේශ පත්‍ර සම්බන්ධයෙන් පවතින ගැටළු පිළිබඳ විමසීම් කල හැක. එසේ විමසීමේදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් ඉල්ලුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

5.9 විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය නීති කෙටුම්පත් සම්පාදක සතු වේ.

5.10 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝණය කළහොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

5.11 අයදුම්පත්‍රය බහාලන කවරයේ වම් පස උඩ කෙලවරේ ''නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සංස්කාරක III ශ්‍රේණියේ සහ ලේඛන සහකාර III ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා වන විවෘත තරග විභාගය - 2022'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

5.12 *අපේක්ෂකයාගේ අනන්‍යතාව* :
විභාග ශාලාධිපති සෑහිමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(*ඇ*) වලංගු රියදුරු බලපත්‍රය.

5.13 **සැලකිය යුතු ය** :

(*අ*) ඉල්ලුම්පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතු ය.

(*ආ*) ඉල්ලූ අවස්ථාවක දී අදළ ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

06. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2022.04.30** වැනි දිනට හෝ ඊට පෙර ''නීති කෙටුම්පත් සම්පාදක, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, අංක 80, අධිකරණ මාවත, කොළඹ 12'' යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

07 *ප්‍රතිඵල නිකුත් කිරීම* :

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් විභාග ප්‍රතිඵල ලේඛනය ලබා දුන් පසු නීති කෙටුම්පත් සම්පාදක විසින් සියලුම අපේක්ෂකයින් වෙත තැපැලෙන් ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ.

08. පත්කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය නීති කෙටුම්පත් සම්පාදක විසින් තීරණය කරනු ලැබේ. පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ කොටසක් පමණක් පිරවීම පිළිබඳ අවසාන තීරණය නීති කෙටුම්පත් සම්පාදක සතු වේ.

09. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

10. මෙම නිවේදනයේ සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව නීති කෙටුම්පත් සම්පාදක විසින් තීරණය කරනු ඇත.

දිල්රුක්ෂි සමරවීර,
නීති කෙටුම්පත් සම්පාදක.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව,
අංක 80 අධිකරණ මාවත, කොළඹ 12.

*ආදර්ශ ඉල්ලුම්පත්‍රය*

*නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ගණයට අයත් සංස්කාරක III ශ්‍රේණියේ සහ ලේඛන සහකාර III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2022*
*Open Competitive Examination for the filling of vacancies in the Posts of Editors and Documetation Assistent in the Legal Draftsman's Department - 2022*

(ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද ඇතුළත් කළ යුතු ය.)

01. ඉල්ලුම් කරන තනතුර : ☐

සිංහල සංස්කාරක - 1
දෙමළ සංස්කාරක - 2
ඉංග්‍රීසි සංස්කාරක - 3
දෙමළ ලේඛන සහකාර - 4
ඉංග්‍රීසි ලේඛන සහකාර - 5

02. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐

සිංහල - 1 දෙමළ - 2 ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න).

03. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :
i. ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.
(උදා: Gunawardhana. M. G. B. S. K.)
ii. සිංහලෙන්/දෙමළෙන් :————.

04. මුලකුරුවලින් හැඳින්වෙන නම :
i. ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.
ii. සිංහලෙන්/දෙමළෙන් :————.

05. ස්ථිර ලිපිනය :
i. ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.
ii. සිංහලෙන්/දෙමළෙන් :————.

06. විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්).

07. ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0 ☐
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න).

08. ජංගම දුරකතන අංකය :————.

09. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

10. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද
ඔව් -1 ☐
නැත -2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න).

11. උපන් දිනය ෑ වර්ෂය ෑ ☐☐☐☐ මාසය ෑ ☐☐ දිනය ෑ ☐☐

12. 2022.04.30 වැනි දිනට වයස ෑ

අවුරුදු :————., මාස :————., දින :————.

13. අධ්‍යාපන සුදුසුකම් ෑ

I. *අ.පො.ස. (සා. පෙළ.) විභාගය*

(i) වර්ෂය :————.
(ii) විභාග අංකය :————.

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

II. අ.පො.ස. (උ.පෙළ.) විභාගය ෑ
(i) වර්ෂය :————.
(ii) විභාග අංකය :————.

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

iii. අදාළ වන වෙනත් අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් ඇත්නම් සඳහන් කරන්න.

iv. වෘත්තීය පළපුරුද්ද

14. i. අධිකරණයක් ඉදිරියේ ඔබ කෙදිනක හෝ කිසියම් වරදකට වරදකරු වී ඇද්ද ?

ඔව් ☐ නැත ☐

ඔව් නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න.

ii. විභාග ගාස්තු
ලදු පත් අංකය :————.
මුදල් ගෙවූ දිනය :————.
මුදල් ගෙවූ බැංකුව සහ ශාඛාව :————.

*ලදුපත නොගැලවෙනසේ මෙහි අලවන්න*

15. *අයදුම්කරුගේ සහතිකය* ෑ

(අ) මෙම ඉල්ලුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව ගෞරව බහුමානයෙන් යුක්ත ව ප්‍රකාශ කර සිටිමි/දිවුරුම් දෙමි.

(*ආ*) මවිසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බැව් හෝ වැරදි බැව් මා තෝරා ගනු ලැබීමට පෙර ඔප්පු වුවහොත්, මා නුසුදුස්සකු බවට තීරණය කරනු ලැබීමට හා පත්වීම ලැබීමෙන් පසු අසත්‍ය බැව් හෝ වැරදි බැව් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව අදාළ ක්‍රියාමාර්ගවලට යටත් ව, සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දන සිටිමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන රීතිවලට මම යටත් වන බව ද විභාගයට අදාළ ගාස්තුව ගෙවා ලබා ගත් ලදුපත මෙයට අලවා ඇති බව ද ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

16. I. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .............................. (සම්පූර්ණ නම) මහතා/මහත්මිය/මෙනවිය මම පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය 2022 ......... මස ......... දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාව තබන්න)

II. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :

ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරියගේ ඉහතින් සපයා ඇති විස්තර මා පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

පදවි නාමය :————.
දිනය :————.
(නිල මුද්‍රාව තබන්න)